# ආයුබෝවන්

## සුභ දවසක්

ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

**2017 වර්ෂයේ අභ්‍යන්තර විගණන ප්‍රගති සමාලෝචන රැස්වීම**

**(ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ 133:5:12 අනුව)**

**2018 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.00 ට ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී**

# අභ්‍යන්තර විගණනයේ දැක්ම

"සකසුරුවම් භාවය හා නීතිමය තත්ත්වය"

# අභ්‍යන්තර විගණනයේ මෙහෙවර

උච්ච පළාත් ජනතාවගේ උන්නතිය සඳහා පළාත් රාජ්‍ය සේවයේ දායකත්වය සහ සම්පත් යෙදවීම් අපේක්ෂිත අරමුණ සහ ඉලක්ක කෙරෙහි ලඟා වීම සම්බන්ධ මූල්‍ය පාලනය පිළිබඳ ඉහළ කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම වෙනුවෙන් නිරීක්ෂණ, නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම.

# පසුගිය වර්ෂ කිහිපයක අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම

| වර්ෂය | සිදුකළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| 2010 | 120 |
| 2011 | 107 |
| 2012 | 160 |
| 2013 | 200 |
| 2014 | 240 |
| 2015 | 210 |
| 2016 | 251 |
| 2017 | 352 |
| 2018 (පෙබරවාරි 27 දින දක්වා) | 51 |
| එකතුව | 1691 |

**2018 වර්ෂයේ අපේක්ෂිත විගණන පරීක්ෂණ සංඛ්‍යාව 400 කි. එය පහත සඳහන් පරිදි සැලසුම් කර ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ අනුමැතිය ලබාදී ඇත. මේ සඳහා සහකාර විගණකාධිපති තුමාගේ එකඟත්වයද ලැබී ඇත.**

| | |
|---|---|
| ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය | 200 |
| ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය | 75 |
| ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 25 |
| ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | 25 |
| ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය | 25 |
| අනෙකුත් කාර්යාල | 50 |

# 2017 වර්ෂයේ විගණන වාර්තා ඉදිරිපත් කිරීම්

| ආයතනය | සිදු කල විගණන පරීක්ෂණ සංඛ්‍යාව | නිකුත් කල විමසුම් ප්‍රමාණය | පිළිතුරු ලැබුණු ප්‍රමාණය |
| --- | --- | --- | --- |
| ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය | 194 | 188 | 104 |
| ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 35 | 34 | 21 |
| ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය | 61 | 58 | 34 |
| ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | 09 | 09 | 08 |
| ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය | 10 | 10 | 08 |
| ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | 02 | 01 | 01 |
| ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය | 01 | 01 | 01 |
| ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 | 01 | 01 |
| ඌව පළාත් සමුපකාර සේවා කොමිෂන් සභාව | 01 | 01 | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | 02 | 02 | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | 01 | 01 | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය | 01 | 01 | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය | 05 | 05 | 04 |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | 02 | 02 | 02 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 26 | 26 | 20 |
| ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 01 | 01 | 01 |
| එකතුව | 352 | 341 | 209 |

# විගණන හා කළමනාකරණ කමිටු කාර්යභාරය

ඌව පළාත් සභා පරිපාලනයට යටත් මූල්‍යමය කටයුතු සිදු කරන සියලුම ආයතන වල විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක මට්ටමේ පවතී. කමිටු ප්‍රමාණය 80 කි. මෙහිදී ආයතන පරිපාලන පද්ධතිය මෙන්ම මූල්‍ය කළමනාකරණය, ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම, වත්කම් පරිපාලනය, සේවක මණ්ඩල කාර්ය සාධනය සහ ආයතනික ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව අවධානය යොමු කරමින් කරුණු සාකච්ඡා කරනු ලැබේ. එසේම කළමනාකරණ සහයක ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර විගණන විමසුම් සම්බන්ධවත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් ඉටු කරමින් මහජනතාව වෙත වගකියන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම් වලින් අනාවරණය වන කරුණු පිළිබඳවද සාකච්ඡා කිරීම මෙම කමිටු වල කාර්ය භාරයක් වී ඇත. එම තත්ත්වය මත වර්තමානයේ ආයතන කාර්යභාරයේ සැලකිය යුතු වර්ධනයක් මෙන්ම නිවැරදි මූල්‍ය කළමනාකරණයකින් ආයතන වල අරමුණු කරා ගමන් කිරීමේ තත්ත්වයක් දක්නට ලැබේ. මෙහිදී අභ්‍යන්තර විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කිරීම, ආයතනයේ පාලන පද්ධතීන් පිළිබඳව අභ්‍යන්තර විගණන වාර්තා මඟින් මතුකර ඇති කරුණු පිළිබඳව මෙන්ම රජයේ විගණනය මඟින් පෙන්වා දෙන කරුණු අනුව අන්‍යොන්‍ය එකඟතාවයකින් කටයුතු කිරීම තුළින් පළාත් සභාවේ ගිණුම් පිළිබඳව විගණන මතයට සැලකිය යුතු දායකත්වයක් මෙම කමිටුව විසින් ලබා දෙනු ලබයි.

ආයතන මට්ටමෙන් මූල්‍ය විචක්ෂණතාවය පවත්වාගැනීමෙන් මනා කාර්ය සාධනයකින් ආයතනයේ අරමුණු කරා ගමන් කරවීමටත් ඒ සම්බන්ධ විධිමත් හා නිවැරදි වාර්තා පවත්වා ගැනීමටත් විගණන විමසුම් අවම කර ගැනීමටත් මෙම කමිටු කාර්යභාරය වැදගත් වේ. මෙහිදී විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් එම කමිටු කාර්යභාරය නිරීක්ෂණය කරන බැවින් කමිටු තීරණ විධිමත් හා නෛතික භාවයක් ගනු ලැබේ. මෙම කටයුත්ත උෟව පළාත් ප්‍රධාන ලේකම් වෙනුවෙන් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයා විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

# පසුගිය වර්ෂ 3 තුළ පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව

| වර්ෂය | විගණන කමිටු සංඛ්‍යාව |
| --- | --- |
| 2015 | 95 |
| 2016 | 128 |
| 2017 | 140 |

## විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාවලිය සිදු කිරීමේදී පහත සඳහන් භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස්/ භාණ්ඩාගාර චක්‍රලේඛ/ රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා පළාත් සභා අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කරනු ලබයි.

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **PN/PE/P/7** හා **2000.03.15** දින
- **DMA/CH 2016 (DMA/2009,1,1 2016.01.21** දරණ චක්‍රලේඛ විධිවිධාන
- **DMA/7 2012.01.13** දරණ චක්‍රලේඛ විධිවිධාන
- **2000.06.12** දිනැති **IAI/2000/1** භාණ්ඩාගාර චක්‍රලේඛ
- ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ **2002.08.23** දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය
- ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක **10/2010** හා **2010.07.27** දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය
- ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක **1/7/3/1** හා **2012.02.13** දිනැති උපදෙස් ලිපිය
- ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක **4/ආ/1/7** හා **2012.08.22** දිනැති අංක **4/2012** දරණ චක්‍රලේඛය

# පළාත් විගණන හා කළමනාකරණ කමිටුව






ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් සියලුම ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් පැවති අවස්ථාවක විගණකාධිපතිවරයාගේ නියෝජනයේ කරුණු ඉදිරිපත් කිරීම.

# සභා ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටුව





# ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව





# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව





# ඌව පළාත් සභාවේ මුදල් රීති වලට අනුකූලව කටයුතු කරමින් මූල්‍ය විචක්ෂණභාවය පවත්වාගැනීම.

ඉහත පෙන්වා දුන් පරිදි විගණනයේ ක්‍රියාත්මක වීමත්, ඒ තුළින් මතුකර දුන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමත්, විගණන හා කළමනාකරණ කමිටු මෙන්ම ලේකම්වරුන්ගේ සාකච්ඡා, ප්‍රගති සමාලෝචන සාකච්ඡා, සහ ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම මත ඌව පළාත් සභා ආයතන වල සැලකිය යුතු මට්ටමකින් ආයතන පරිපාලන මෙන්ම මූල්‍ය පරිපාලනය, අරමුණු කරා ගමන් කිරීම නෛතික භාවයකින් සහ කාර්යක්ෂමතාවයකින් මෙන්ම මූල්‍ය විචක්ෂණ භාවයකින් සිදුවී ඇත. එසේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව විසින් රාජ්‍ය විගණනයේ සම්බන්ධීකරණයෙන් සිදු කල අධීක්ෂණ වැඩසටහනකට රාජ්‍ය අංශයේ ආයතන 831 ක් සම්බන්ධ කරගෙන ඇත. මෙම වැඩසටහනින් ඉහළම කාර්ය සාධනයක් තෝරා ගත් ආයතන 81 කට ජනාධිපති සම්මාන පිරිනැමීමට කටයුතු යොදන ලදී. මේ අතුරින් ආයතන 08 ක් ඌව පළාත් සභාවේ ආයතන වීම සුවිශේෂී තත්ත්වයකි.

පහත සඳහන් ආයතන ඒ සඳහා සුදුසුකම් ලැබූ අතර ඉදිරි වර්ෂ වල අනෙකුත් ආයතනද තම කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම තුළින් ඒ සඳහා අවස්ථාව ලබාගත හැකිය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් පහත සඳහන් ආයතන එම සම්මාන ලබාගන්නා ලදී.

- ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - රන් සම්මානය
- මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව - රන් සම්මානය
- ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - රන් සම්මානය
- ඌව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව - රන් සම්මානය
- ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - රන් සම්මානය
- සමුපකාර සේවක කොමිෂන් සභාව - රන් සම්මානය
- මැදගම ප්‍රාදේශීය සභාව - රිදී සම්මානය
- ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - රිදී සම්මානය
- හපුතලේ ප්‍රාදේශීය සභාව - කුසලතා සහතිකය













# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| අමාත්‍යාංශය | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂි උපදේශනය | නිසි අධීක්ෂණය සහ පසු විපරම් කිරීම මෙන්ම ජාතික හා පළාත් මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සිදු කල යුතු බව | අමාත්‍යාංශ ලේකම්/ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂි උපදේශනයේ අඩුපාඩු පවතී. ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් දායකත්වයක් කෘෂි උපදේශක කාර්යාල වලින් ලැබී නොමැත. |

# තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

- කෘෂිකර්ම ක්ෂේත්‍රය (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)

පසුගිය වර්ෂයේ ක්‍රියාත්මක වූ බිම් හැඩය වෙනස් කිරීමේ ව්‍යාපෘතිය තුළින් සීමිත ඉඩකඩින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමත් එම ස්ථානයට නවීන යන්ත්‍ර සූත්‍ර සහ තාක්ෂණය භාවිතා කරමින් ඉහළ ඵලදායීතාවයක් ලබා ගැනීමක් අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන් රිදීමාලියද්ද සියබලේයාය කෘෂි උපදේශක කොට්ඨාසයේ ක්‍රියාත්මක අදාළ ව්‍යාපෘතියේ නිරීක්ෂණය කල අතර පහත තත්ත්වයන් පිළිබඳවද තවදුරටත් අවධානය යොමු කල යුතුය.

i. බිම් සැකසුම් කිරීමේදී නිසි පරිදි ජලය සෑම ස්ථානයකටම සමානව ගලා යන ආකාරයෙන් සකස් නොකිරීම.
ii. බලාපොරොත්තු වූ සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය වගා කිරීමට මෙම නිසා නොහැකි වීම.
iii. සමහර ස්ථාන සඳහා යන්ත්‍ර සූත්‍ර ඇතුල් කිරීමේ අපහසුව.
iv. කැණීම් කටයුතු නිසා අභ්‍යන්තර පස් මතුවීම හේතුවෙන් වී වගාව නිසරු වී තිබීම.

මෙම ව්‍යාපෘතිය සඳහා රු. 2,582,620.00 ක මුදලක් වැය කර ඇත. නමුත් මෙම ව්‍යාපෘතිය නිසි පරිදි නිමකර නොමැති බව පහතින් ඉදිරිපත් කරමි.





අනෙක් පසට ජලය රැස්වීමට වැලි කොට්ට පුරවා
ලියද්දෙහි එක් පසක් ඔසවා ඇති අයුරු



වී වපුරා ඇති ලියද්දක එක් පසක ජලය නොපිරෙන අයුරු




එක් පසක ජලය වැඩිපුර රැඳීම හේතුවෙන් අමතර කෙටි නියරක් යොදා ඇති අයුරු



එක් පසක ජලය වැඩිපුර රැඳීම හේතුවෙන්
අමතර කෙටි නියරක් යොදා ඇති අයුරු

විශාල මුදල් ප්‍රමාණයක් වැය කොට සකස් කරන ලද වගා භූමිය සැලකිය යුතු අධීක්ෂණයකින් යුතුව පවත්වාගෙන යා යුතු අතර වගාව සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ගොවීන් වෙත ලබා දීම කෘෂි උපදේශකවරුන්ගේ වගකීම වේ. නමුත් එවැනි තත්ත්වයක් මෙම ස්ථානය පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවීය.













කෙසේ නමුත් මෙවැනි මුදලක් වැය නොකර සාමාන්‍ය තත්ත්වයෙන් මෙම ස්ථානයේ පවතින වී වගා කර ඇති ස්ථාන හොඳින් පවතී.



මෙහිදී විගණනය වෙත නිරීක්ෂණය වූයේ වැඩිදියුණු කල ස්ථානයේ ගොවීන් වෙනුවෙන් නියමිත කෘෂි උපදේශනය මෙන්ම වගා භූමිය සකස් කිරීමේදී පෙන්වා දුන් අඩුපාඩු වගාවන් සඳහා බලපා ඇති බවය.

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| අමාත්‍යාංශය | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| මාර්ග අමාත්‍යාංශය | විවිධ ඉදිකිරීම් නිසා මාර්ග පද්ධතීන් වලට සිදුවන හානි සහ මාර්ග සංවර්ධනයේ අඩුපාඩු | මාර්ග අළුත්වැඩියාවේදී මහජන ගමනාගමනය සඳහා ඉඩ සලසා දීම අදාළ නිලධාරීන්ගේ වගකීම වේ. එසේම මෙම කටයුතු නිසි පරිදි අධීක්ෂණය සිදු කල යුතු බව | අමාත්‍යාංශ ලේකම්/ පළාත් මාර්ග අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය ඉංජිනේරුව රුන් | තැන්පත් මුදල් වලින් සහ වාර්ෂික ප්‍රතිපාදන උපයෝගී කරගෙන මාර්ග අළුත්වැඩියා කිරීම් ආරම්භ කර ඇති අතර මෙම කටයුතු ප්‍රමාද වීම නිසා පවතින කාලගුණය නිසි පරිදි මාර්ග අළුත්වැඩියාවට බාධා ඇති කර ඇත. මෙහිදී කොන්ත්‍රාත්කරුවන්ගේ යම් යම් ක්‍රියා කලාපයන්ද මාර්ග පද්ධති වලට හානි දායක බැවින් ඒ සම්බන්ධව අධීක්ෂණය වැඩි දියුණු කල යුතුය. තවදුරටත් මෙම සාකච්ඡාව අවසානයේදී තවදුරටත් අවධානය යොමු කල යුතු කරුණු යටතේ එම අඩුපාඩු ඉදිරිපත් කරනු ලැබේ. |

## ජල නල එළීම ඇතුළු විවිධ අවශ්‍යතාවයන් සඳහා මාර්ග පද්ධතියේ සිදු කරනු ලබන පළුදු කිරීම් හා ඒවා නැවත යථා තත්ත්වයනට පත් කිරීමේදී මතුවන ගැටළු පිළිබඳ දැනුවත් කිරීම







බණ්ඩාරවෙල හීල්ඔය, මකුල්ඇල්ල මාර්ගයන්

# තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

- **මාර්ග අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීම් ක්ෂේත්‍රය (මාර්ග දෙපාර්තමේන්තුව)**

මාර්ග අළුත්වැඩියා කිරීමේදී සහ නඩත්තු කිරීමේදී දෙවන වර තාර ආලේපනය කිරීම එක් ක්‍රමවේදයකි. මෙම කටයුත්ත නිසි පරිදි සිදු නොකිරීමක් විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී හෙළිදරව් විය.

උදාහරණ - ඌව පරණගම බෙරලියපොල බෝකෝට්ටුතැන්න මාර්ගය

මාර්ගය අධීක්ෂණය - වැලිමඩ මාර්ග ඉංජිනේරු කාර්යාලය
ඇස්තමේන්තු මුදල - **2,421,000.00**

මෙහිදී යෙදූ තාර මිශ්‍රණයන් උණුවී දියර වශයෙන් තැවරීමත් මාර්ගයේ ගමන් කිරීමේ අපහසුවක් විගණනය වෙත නිරීක්ෂණය විය. මෙහිදී නිසි පරිදි කර්මාන්තය සිදු නොකිරීම හා අධීක්ෂණ දුර්වලතා මේ සඳහා බලපා තිබේ. වර්තමාන තත්ත්වයන් පහත පරිදිය.






• බණ්ඩාරවෙල හීල්ඔය මාර්ගය

මෙම මාර්ග සංවර්ධනය කිරීමේදී මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් මාර්ග මතුපිට පෘෂ්ඨයටද හානි වන පරිදි කටයුතු කරමින් පවතී. මෙම හේතුව මත මාර්ගයට පසු කාලීනව යම් බලපෑම් සිදු විය හැකි අතර අනවශ්‍ය මුදල් වැය කිරීමක්ද ඉදිරියේදී සිදු විය හැක. මාර්ගය පළුදු කිරීමක් සිදු නොකර අවශ්‍ය නම් නවීන යන්ත්‍ර සූත්‍ර මඟින් අවශ්‍ය කොටස පමණක් යම් ක්‍රමානුකූලව සකස් කර ගැනීමේ හැකියාව ඇත. නමුත් නිසි උපදෙස් හා අධීක්ෂණයක් නොමැති කමින් පහත සඳහන් තත්ත්වයන් සිදුවී ඇත.









- **මාර්ග ඉංජිනේරු කාර්යාලය - දියතලාව**

**නිවැරදි සැලසුම් කිරීම සහ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම මත රු. 4,152,000.00 ක ඇස්තමේන්තුවකට අනුව රු. 3,531,906.00 ක ගිවිසුම් මුදලකට ඉදිකරන ලද පැති බැම්ම පහතින් දැක්වේ.**

මහ උල්පත කන්දේ අරාව මාර්ගයේ ඉදිකළ ආරක්ෂිත පැති බැම්ම ( **Gabion wall)** පුපුරායාම

පීඩනයට ඔරොත්තු දෙන ලෙසින් සැලසුම් සකස් නොකිරීම, අධීක්ෂණයේ දුර්වලතා මෙම පැති බැම්ම පෙරලී යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය කරමි.

ඉදිකොට තිබූ පැති බැම්ම (GABION WALL) තල්ලු වී ගොස් තිබූ අතර මතුපිට කොන්ක්‍රීට් තට්ටුවද පිපිරීමට ලක්වී ඇති බව නිරීක්ෂණය විය.





# කොන්ක්‍රීට් ස්ථරය පුපුරාගොස් තිබූ ස්ථානයන් වැසීමට උත්සහාගෙන ඇති අයුරු



# බැම්ම ඉදිරියට තල්ලු වීම නිසා හිස් අවකාශයක් ඇතිව තිබූ අයුරු



බැම්ම තල්ලුවීම මත හෝ බැම්මට පිරවූ පස් මනා ලෙස තැලීමට ලක් නොකිරීම මෙන්ම නිවැරදිව සැලසුම් නොකිරීම මත මාර්ගය ගිලාබැසීමට ලක්ව ඇති බව නිරික්ෂණය විය.






මෙසේ මාර්ගය ගිලා බැසීම හේතුවෙන් වර්ෂා ජලය මෙම ස්ථානයෙන් ගලා ගෙන යාම හේතුවෙන් බැම්මට ඉදිරියේ දි වන හානිය තව දුරටත් වැඩි වනු ඇත.

පැති බැම්ම තල්ලු වීම මත මාර්ගය ගිලා බැසීම හා මාර්ගය පුපුරා යාම වැසෙන පරිදි (පිටතට නොපෙනෙන පරිදි) අලුතින් තාර තට්ටුවක් විගණන දින උදේ වරුවේ යොදා ඇති බව නිරීක්ෂණය විය.



# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| අමාත්‍යාංශය | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය | ඖෂධ පරිපාලනය | ඖෂධ පරිපාලනය සම්බන්ධයෙන් සහ ගබඩා කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතු බව | අමාත්‍යාංශ ලේකම්/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ | වෙන්වී ඇති ප්‍රතිපාදන තුළ සැලකිය යුතු මට්ටමකින් ඖෂධ ගබඩා සහ ඖෂධ පරිපාලන කටයුතු සිදුවෙමින් පවතී |

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| අමාත්‍යාංශය | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | පාසල් පද්ධතීන් තුළ සිදු කරන කර්මාන්ත නිසා සිසු දරුවන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය සඳහා ගැටළු ඇතිවීම | මෙවැනි බාධාකාරී තත්ත්වයන් දරු දැරියන්ගේ විශේෂයෙන් බලපාන බැවින් කොන්ත්‍රාත් කරුවන් දැනුවත් කිරීම සහ ප්‍රමාණවත් පරිදි අධීක්ෂණයක් සිදු කල යුතු බවත් එසේම කර්මාන්ත තෝරා ගැනීමේදී අවශ්‍යතාවය මත ප්‍රමුඛත්වය ලබා දිය යුතු පාසල් සහ පහසුකම් පිළිබඳ අවධානය යොමු කල යුතු බවත් පෙන්වා දෙන ලදී. | අමාත්‍යාංශ ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප සහ කොට්ඨාස අධ්‍යක්ෂවරුන් | ඉහළ කළමනාකරණය යම් යම් තීන්දු තීරණ ලබාගෙන උපදෙස් ලබා දී ඇතත් මුදල් ප්‍රතිපාදන නොලැබීමේ තත්ත්වයන් මත බොහෝ කර්මාන්ත අතරමග නැවතී ඇති තත්ත්වයක් නිරීක්ෂණය වේ. එම තත්ත්වයන් බොහෝ විට දරු දැරියන්ගේ ආරක්ෂාවටද අධ්‍යාපන කටයුතු සඳහාද බලපෑම් ඇති කරයි. එසේම අදාළ ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් මෙන්ම තවදුරටත් අනාරක්ෂිත තත්ත්වයේ පවතින ස්ථාන මෙම සාකච්ඡාවෙන් පසුව ඉදිරිපත් කරනු ලැබේ. |

# අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරීක්ෂණය වූ තත්ත්වයන් කිහිපයක්



රිල්පොල ධර්මරාජ විදුහල, සිරිමල්ගොඩ මහ විද්‍යාලය, හැතැක්ම විදුහල

වර්තමානය වන විට බ/ රිල්පොල ධර්මරාජ විද්‍යාලයේ අදාළ ගොඩනැගිල්ල පැවති අයුරින්ම පන්ති කාමරයක ඉගැන්වීම් කටයුතු සඳහා භාවිතා කරනු නිරීක්ෂණය විය.





බ/ හැතැක්ම විද්‍යාලයේ පැවති සංගීත කාමරය මෙම ස්ථානයෙන් ඉවත් කොට අනෙකුත් පන්ති පැවැත්වෙන ස්ථානයකට ගෙන ගොස් ඇත.

ඉදිරියේදී හෝ මෙම පාසල් සඳහා ගොඩනැගිලි පහසුකම් ලබාදීම සුදුසු වනු ඇත.

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය | ප්‍රාථමික අධ්‍යාපන යේ සාධනීය මට්ටම් වල තිබෙන අඩුපාඩු | සම්ප්‍රදායක් වශයෙන් විභාග ප්‍රතිඵල අවම මට්ටමෙන් පවත්වාගෙන විදුහල්පතිවරුන්ගෙන් සහ ගුරුභවතුන් සම්බන්ධයෙන් තීරණ ගැනීම | අමාත්‍යාංශ ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් | තවදුරටත් මෙම අඩුපාඩුව නිරීක්ෂණය වේ. |

# ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය

| පාසල | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් | ලියූ | සමත් |
| සේරව ප්‍රාථමික විද්‍යාලය මොණරාගල | 7 | 0 | 0 | 0 | 4 | 0 | 4 | 0 | 5 | 0 | 6 | 0 | 4 | 0 | 12 | 0 |
| මො/ අගුණකොලපැලැස්ස විදුහල වැල්ලවාය | 22 | 0 | 19 | 0 | 22 | 0 | 20 | 0 | - | - | 18 | 0 | - | - | 19 | 0 |
| බ/ අරාව මහ විද්‍යාලය මහියංගණ කලාපය | 30 | 0 | 25 | 0 | 20 | 0 | 18 | 0 | 26 | 0 | - | - | - | - | 19 | 0 |
| මො/ කුකුරම්පොල කණිෂ්ඨ විද්‍යාලය වැල්ලවාය | 33 | 0 | 30 | 0 | 40 | 0 | 37 | 0 | 22 | 0 | - | - | 11 | 0 | 36 | 0 |
| මො/කෝන්ගස්පිටිය කණිෂ්ඨ විද්‍යාලය මොණරාගල | 9 | 0 | 10 | 0 | 16 | 0 | 16 | 0 | 11 | 0 | 9 | 0 | - | - | 19 | 0 |
| බ/ අලුකැටියාව විදුහල | 11 | 0 | 4 | 0 | 10 | 0 | 10 | 0 | 9 | 0 | 10 | 0 | - | - | 20 | 0 |
| බ/ අරාවවත්ත විදුහල මහියංගනය | - | - | 23 | 1 | 25 | 0 | 14 | 2 | 23 | 0 | - | - | 26 | 0 | 16 | 1 |
| බ/කරගහහමඩ විදුහල මීගහකිවුල | 19 | 1 | 20 | 0 | 16 | 0 | 23 | 0 | 25 | 0 | - | - | 24 | 0 | 18 | 0 |

# තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

- # අධ්‍යාපන ක්ෂේත්‍රය

පාසල් අධ්‍යාපන සංවර්ධන මට්ටම් වැඩිදියුණු කර ගනිමින් කලාප මට්ටමේ සහ පළාත් දෙපාර්තමේන්තු මට්ටමේ නිසි අධීක්ෂණයක් මෙන්ම උපදෙස් මත 2017 වර්ෂයේ අ.පො.ස උසස් පෙළ කලාප මට්ටමේ ස්ථානයන් පසුගිය වර්ෂය සමඟ පහත පරිදි ඉදිරිපත් කරමි.

| කලාපය | වර්ෂය | | | | | | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | 2015 | | | 2016 | | | 2017 | | |
| | ඉදිරිපත් වූ සිසුන් ගණන | සමත් ප්‍රතිශතය | පළාතේ ස්ථානය | ඉදිරිපත් වූ සිසුන් ගණන | සමත් ප්‍රතිශතය | පළාතේ ස්ථානය | ඉදිරිපත් වූ සිසුන් ගණන | සමත් ප්‍රතිශතය | පළාතේ ස්ථානය |
| බදුල්ල | 2526 | 60.57 | 09 | 2629 | 60.06 | 09 | 2492 | 60.43 | 09 |
| බණ්ඩාරවෙල | 3111 | 61.59 | 08 | 3241 | 61.86 | 08 | 3128 | 66.84 | 06 |
| වැලිමඩ | 1639 | 65.95 | 03 | 1670 | 64.73 | 05 | 1661 | 72.13 | 04 |
| වියළුව | 414 | 68.84 | 01 | 465 | 67.53 | 01 | 428 | 74.07 | 01 |
| පස්සර | 441 | 65.31 | 05 | 486 | 62.35 | 07 | 372 | 65.05 | 08 |
| මහියංගණය | 1125 | 67.02 | 02 | 1240 | 62.66 | 06 | 1133 | 71.32 | 05 |
| බිබිල | 1131 | 62.69 | 07 | 1219 | 65.55 | 03 | 1132 | 72.53 | 03 |
| මොණරාගල | 1467 | 65.71 | 04 | 1526 | 65.27 | 04 | 1479 | 66.13 | 07 |
| වැල්ලවාය | 1918 | 63.10 | 06 | 1150 | 66.70 | 02 | 1058 | 72.68 | 02 |
| තණමල්විල | - | - | - | 744 | 58.23 | 10 | 721 | 58.25 | 10 |

මෙහිදී පැවති ස්ථානයට වඩා ඉහළ ස්ථානයක් හිමි කර ගැනීම සම්බන්ධයෙන් අදාළ කලාප කාර්යාල අගය කල යුතුය. පැවති ස්ථානයට වඩා අඩු අගයක් ලැබූ කලාප කාර්යාල වල අධ්‍යාපන සංවර්ධන මට්ටම් ඉදිරියේදී වැඩි කර ගැනීමට කටයුතු කල යුතුය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ හා පළාත් දෙපාර්තමේන්තු මට්ටමින් විශේෂ අවධානයක් යොමු කල යුතුය.

# අධ්‍යයන කාර්ය මණ්ඩල විශ්ලේෂණය

| කලාපය | සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය | සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය | ඌණතාවය | අතිරික්තය |
|---|---|---|---|---|
| පස්සර | 793 | 670 | 123 | - |
| බිබිල | 1487 | 1508 | - | 21 |
| මීගහකිවුල | 951 | 944 | 07 | - |
| මහියංගනය | 1740 | 1401 | 339 | - |
| මොණරාගල | 2047 | 1827 | 220 | - |
| වැල්ලවාය | 2422 | 2003 | 419 | - |
| බණ්ඩාරවෙල | 1426 | 1784 | - | 358 |
| වැලිමඩ | 1858 | 1826 | 32 | - |

අතිරික්ත ගුරු කාර්ය මණ්ඩලයන් හැකිතාක් දුරට ගුරු කාර්ය මණ්ඩල අත්‍යවශ්‍ය කලාපයන් වෙතට යොමු කල හැකි පරිදි ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් විය යුතුය.


විදුහල් වල අවශ්‍යතා සඳහා ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ලබාදුන් පහසුකම් ව්‍යාපෘතිය අවසන් කර තිබුණද ලබා නොගන්නා තත්ත්වයක් නිරීක්ෂණය විය.





මො/ බෝගහපැලැස්ස විදුහල

# මො/ බෝගහපැලැස්ස විදුහල








- මධ්‍යම රජයේ ප්‍රතිපාදන මත පළාත් සභා නිලධාරීන්ගේ අධීක්ෂණය මත බණ්ඩාරවෙල විශාඛා මහ විද්‍යාලයේ පැති බැම්ම ඉදිකිරීම.

නිවැරදි සැලසුම් කිරීම සහ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම මත රු. ලක්ෂ 10 ක් පමණ වියදමෙන් සිදු කරන පැති බැම්ම පහත ඡායාරූප වලින් පෙනෙන පරිදි කඩා වැටීමට ලක් වී ඇත.

## බණ්ඩාරවෙල විශාබා විද්‍යාලීය ඉදිරි පැති බැම්ම

**2015-2016 වර්ෂයන්හි අළුතින් ඉදිකොට තිබූ විද්‍යාලය ඉදිරිපිට ආරක්ෂිත පැති බැම්ම මෙම මස මුලදී පෙරලී ගොස් තිබුණි.**







**ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය (මඩ ගල්) භාවිතය, පීඩනයට ඔරොත්තු දෙන ලෙසින් සැලසුම් සකස් නොකිරීම, අධීක්ෂණයේ දුර්වලතා මෙම පැති බැම්ම පෙරලී යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය කරමි**

- **ඉදිකිරීම් ක්ෂේත්‍රය (පළාත් පාලන)**

- **මීගහකිවුල බස් නැවතුම්පල ඉදිකිරීම.**

  **(පුරනැගුම ව්‍යාපෘතිය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව)**

**මෙම බස් නැවතුම්පල රු. 22,750,512.65 ප්‍රමාණයක් වැය කර අවසන් කර ඇති නමුත් 2015 වර්ෂයේ සිට භාවිතා කිරීමක් සිදු නොවේ. එම තත්ත්වය නිසා ඉදිරි විගණකාධිපති වාර්තාවේ නිස්කාර්යය වත්කම් යටතේ විගණන විමසුම් වලට යොමු වීමට සිදුවීමට ඉඩ ඇත.**






- **බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව - හීල්ඔය උප කාර්යාලය ඉදිකිරීම (පුර නැගුම ව්‍යාපෘතිය)**

**රු. මිලියන 35 ක් පමණ වැයකර මෙම ගොඩනැගිල්ල ඉදිකර අවසන් වූවත් මේ දක්වා ප්‍රමාණවත් මට්ටමින් ප්‍රයෝජනයට ගනු නොලැබේ. මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් සකස් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හීදී මෙය දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබා දෙන පදනම මත වාර්ෂිකව රු. 109,000.00 මුදලක් ගෙවීමට කටයුතු කරනු ලබයි. මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති ස්ථානය අනුව ඉදිරියේදී ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමේ හැකියාවක් නිරීක්ෂණය නොවේ. මෙම වියදමද ඉදිරි විගණකාධිපති වාර්තා වල විමසුමට භාජනය විය හැකි තත්ත්වයකි.**





මෙම ගොඩනැගිලි භාවිතා කරමින් ප්‍රතිලාභ ලබා නොගැනීම ඉදිරියේදී විගණන විමසුම් වලට තුඩුදෙන කරුණු වනු ඇත. මේ සඳහා ඉහළ කළමනාකරණයේ මැදිහත් වීම් අත්‍යවශ්‍ය වේ.

- **බණ්ඩාරවෙල මහ නගර සභාව - තොග පොළ ඉදිකිරීමේ කර්මාන්තය (සභා අරමුදල්)**

**මෙම ඉදිකිරීම රු. 295,839,499.62 ක පමණ ඇස්තමේන්තුවක් සහිතව ඉදිකිරීම් 2014 වර්ෂයේ ආරම්භ වූවත් මේ වන තෙක් සම්පූර්ණ නොකිරීම නිසා නගර සංවර්ධනයට මෙන්ම නගර අලංකාරයට සහ සෞඛ්‍යාරක්ෂිත බවට විශාල තර්ජන මතුව ඇත. මේ පිළිබඳව ඌව පළාත් සභාවේද සාකච්ඡාවට භාජනය වී ඇති අතර විගණකාධිපති වාර්තාවටද විමසුමක් වශයෙන් ඉදිරිපත් වීමට නියමිතය. වර්තමානය පහත පරිදි වේ.**






- ඇල්ල ප්‍රාදේශීය සභාව අනවසර ඉදිකිරීම්

මෙම ප්‍රාදේශීය සභාවට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී **242** ක පමණ අනවසර ඉදිකිරීම් නිරීක්ෂණය වන ලදී. මෙහිදී පාරිසරික මෙන්ම සාමාජීය ගැටළු සිදු වීමක් නිරීක්ෂණය වන අතර විධිමත් පරිදි අනුමත කරවා ගැනීම තුළින් සැලකිය යුතු ආදායමක් ප්‍රාදේශීය සභාව වෙත අයකර ගැනීමේ හැකියාවද ලැබී නොමැත. මේ පිළිබඳව කඩිනම් අවධානය යොමු කල යුතුය. ස්ථාන කිහිපයක තොරතුරු පහත පරිදි වේ.













- ආදායම් ක්ෂේත්‍රය

ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

හිඟ පිරිවැටුම් බදු අවසානයට රු. 41,000,000.00 (දළ වශයෙන්)

මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් පියවරයන් ගත යුතුය. මෙම ප්‍රමාණයද ඉදිරි විගණකාධිපති වාර්තාවට යොමු වීමට නියමිතය.

- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අය විය යුතු හිඟ ඉඩම් බදු ප්‍රමාණය රු. 78,000,000.00 පමණ වේ. (මේ පිළිබඳව ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2018.02.21 දින පවත්වන ලද සාකච්ඡාවේදී ලබාදුන් උපදෙස් පිළිබඳව අවධානය යොමු කල යුතුය.)

i. ආදායම් ප්‍රඥප්ති සකස් කිරීම සහ අය කිරීමට පියවර ගැනීම.
ii. නව ආදායම් ප්‍රභවයන් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කිරීම.
iii. නිශ්චිත ඉලක්ක නියම කර ගනිමින් කාර්තුමය වශයෙන් ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම.
iv. පළාත් පාලන ක්ෂේත්‍රයේ හිඟ ආදායම් අය කිරීම් සඳහා කටයුතු කිරීම.
v. ඉඩම් ආදායම් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡා කර නීතිමය කටයුතු කිරීමට පියවර ගැනීම.
vi. ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| අමාත්‍යාංශය | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | භාණ්ඩ සමීක්ෂණය | පළාත් අරමුදල මත ප්‍රතිපාදන ලබා ගන්නා භාණ්ඩ ලේඛනගත කිරීම නිසා සමීක්ෂණය සිදු කිරීම වැදගත් බව පෙන්වා දෙන ලදී | අමාත්‍යාංශ ලේකම්/ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ | මෙම කාර්යය ප්‍රමාණවත් මට්ටමින් සිදුවේ. |

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| රථවාහන පරිපාලනය | රථවාහන අනතුරු බහුල වීම | රියදුරන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, රියදුරන් සඳහා සීමාවන් පැණවීම, අවවාද කිරීම සහ පරීක්ෂණ සිදු කිරීම | ඌව පළාත් ප්‍රධාන ලේකම්/ සියලුම ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් | කටයුතු කරමින් පවතී |
| | ධාවනයෙන් ඉවත් කල වාහන | අළුත්වැඩියාවන් සිදු කිරීම හෝ රාජ්‍ය දේපළ විනාශ වී යාම වළක්වා ගැනීම | | |
| | වාහන භාවිතා නොකිරීම | රාජ්‍ය දේපල භාවිතා නොකිරීම මත විනාශ විය හැකි බැවින් ඒ සඳහා පිළියම් යෙදීම | | |

# භාවිතයෙන් ඉවත් කර ඇති වාහන



පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කතරගම ප්‍රාදේශීය සභාව, කන්දකැටිය ප්‍රාදේශීය සභාව ආදියෙන් කිහිපයක්




පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කතරගම ප්‍රාදේශීය සභාව, ඌවපරණගම ප්‍රාදේශීය සභාව, හාලිඇල ප්‍රාදේශීය සභාව ආදියෙන් කිහිපයක්

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

| | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| කසල කළමනාකරණය සහ මල අපද්‍රව්‍ය කළමනාකරණය | සාමාජීය සහ පාරිසරික ගැටළු ඇතිවීම | ඉදිරි වැඩසටහන් සකස් කිරීම සහ මෙවැනි තත්ත්වයන් සඳහා කඩිනම් විසඳුම් ලබා දීම | පළාත් පාලන ලේකම්/ පළාත් පාලන කොමසාරිස්/ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්/ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන් | කටයුතු කරමින් පවතී |

# කසල කළමනාකරණය හා මළ අපවහනය




මහියංගන ප්‍රාදේශීය සභාව, හපුතලේ ප්‍රාදේශීය සභාව, බණ්ඩාරවෙල නගර සභාව


මහියංගන ප්‍රාදේශීය
සභාවේ ඝන අපද්‍රව්‍ය
මධ්‍යස්ථානය


ලොග්ගල් ඔය අසල වන
රක්ෂිතයට අපද්‍රව්‍ය බැහැර
කිරීම - කන්දකැටිය
ප්‍රාදේශීය සභාව


මල අපද්‍රව්‍ය බැහැර කිරීම
- හපුතලේ සහ
බණ්ඩාරවෙල නගර සභා
05 05 2017
05 05 2017

# වර්තමානයේ බදුල්ල මහ නගර සභාවේ කුණු කසල බැහැර කිරීම හා කසල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය













# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡා රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම 2017.06.13 දින

## ජංගම ගිණුම් වල විශාල වශයෙන් මුදල් රඳවා තැබීම

| ආයතනය | ගිණුම් අංකය | දිනය | මුදල |
|---|---|---|---|
| ඔක්කම්පිටිය බීජ ගොවිපල | 0681-00186753441 - මහජන බැංකුව | 2017.03.31 | 13,822,983.00 |
| රජයේ සත්ත්ව ගොවිපල, බොරලන්ද | 209100110000253 - මහජන බැංකුව | 2017.04.30 | 10,926,831.27 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, බදුල්ල | 182548336 - මහජන බැංකුව | 2017.04.30 | 162,987,756.00 |
| මහ නගර සභාව, බණ්ඩාරවෙල | 037-1001-5-2593607 | 2017.04.30 | 51,232,416.00 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 269-1-001-2-8440336 | 2017.04.30 | 7,348,877.00 |
| ප්‍රාදේශීය ඉංජිනේරු (මාර්ග) කාර්යාලය, මොණරාගල | 068-1001-36752-726 - මහජන බැංකුව | 2017.05.31 | 6,744,288.02 |

| | සාරාංශගත කරුණු | ගරු ආණ්ඩුකාරතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමාගේ තීරණය | වගකීම | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| මූල්‍ය පරිපාලනය | ජංගම ගිණුම් වල මුදල් රඳවා ගැනීම | අවශ්‍යතාවය මත පමණක් මුදල් රඳවා ගෙන ඉතිරි මුදල් පළාත් භාණ්ඩාගාරය වෙත යොමු කිරීම | සියලුම ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් | මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳ අධීක්ෂණය කරනු ලැබේ. මේ වන විට ජංගම ගිණුම් වල අතිරික්ත මුදල් ශේෂයන් නිරීක්ෂණය නොවේ. |

# සාකච්ඡාවේ අවසානය

ඌව පළාතේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙනුවෙන් නිරන්තරයෙන් මඟ පෙන්වීම් උපදෙස් හා අවශ්‍ය සම්පත් සම්පාදනය කර දෙනු ලබන ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් ප්‍රධාන ලේකම්තුමන් සහ ආණ්ඩුකාරවර ලේකම්තුමාටත්,

විගණන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධයෙන් සහයෝගය දක්වන පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු පළාත් සභා කාර්ය මණ්ඩලයටත්,

උනන්දුවෙන් හා කාර්යක්ෂමභාවයෙන්, වගකීමෙන් කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ අරමුණු කරා ලගාවීමට කැපවී කටයුතු කරනු ලබන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් ලබා දෙන සහයෝගයටත් ස්තූතිය පුද කරමි.

එසේම තවදුරටත් ප්‍රමාණවත් වූ නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරියේදී ලබා දීමට හැකියාව තිබේ නම් සැලකිය යුතු විගණන පරීක්ෂණ සංඛ්‍යාවක් සිදු කිරීමේ හැකියාව පවතින බවත් පෙන්වා දෙමි.

දෙපාර්තමේන්තුවක් වශයෙන් ගත් කල 2015 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ නිලධාරීන් පළපුරුදු නිලධාරීන් 12 දෙනෙකු ස්ථාන මාරු වී යාම විගණන කටයුතු සඳහා සැලකිය යුතු මට්ටමකින් බලපාන ලදී. එසේම පළාත් සභා පරිපාලනයට යටත් ආයතන 1300 ආසන්න සංඛ්‍යාවක විගණන කටයුතු කිරීම සඳහා, විශේෂ විමර්ශන කටයුතු සඳහා, ගිණුම් කාරක සභා සහ වෙනත් ආයතන විසින් ඉල්ලා සිටින පරීක්ෂණ කටයුතු සඳහා අවම වශයෙන් විගණන නිලධාරීන් 50 කට ආසන්න සංඛ්‍යාවකගේ අවශ්‍යතාවය පවතී. වර්තමානයේ සිටින විගණන නිලධාරීන් ප්‍රමාණය 18 කි. මෙම නිලධාරීන්ගෙන් බොහෝදෙනෙක් නවක නිලධාරීන් වන අතර ඉතාමත් දැඩි කැප කිරීමකින් උපරිම කාර්යක්ෂමතාවයකින් කටයුතු කිරීම මත අපේක්ෂිත විගණන ඉලක්කය ඉක්මවීමට වර්ෂය තුළදී හැකියාව ලැබුණි.

මෙම තත්ත්වය මත විගණන නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය විශාල පරිශ්‍රමයක් දරන බැවින් ඒ වෙනුවෙන් ඔවුන් සඳහා ප්‍රශංසා ලිඛිතව ලබා දීමත් ඉදිරි වර්ෂවල හැකියාවක් තිබේ නම් විගණන වාර්තා පදනම් කරගෙන යම් කිසි අතිරේක දීමනාවක් ලබා දීමත් කාරුණිකව යෝජනා කරමි. එසේම අවශ්‍ය කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම්තුමාගේ උපදෙස් මත මේ වන විටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාල වලින් කටයුතු ආරම්භ කර ඇති බැවින් ඒ සම්බන්ධව ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙසත් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

වී.පී. විමල් කරුණාතිලක

ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ

ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

# ස්තූතියි... !